# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

# පුරප්පාඩු

## මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා අපේක්ෂිත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. කාර්මික (Mechanic) II ශ්‍රේණිය

වැටුප් පරිමාණය : රු. 15650 - 16x140-17890 (U-PL3III)

**සුදුසුකම්**

1. කියවීමට හා ලිවීමට හැකියාවක් තිබිය යුතුය.
2. (අ) පරිමාණ, සූක්ෂම මාන කියවීම සහ භාග වලින් මාන සටගන් තැබීම.
   (ආ) වාෂ්ප, මෝටර් සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණ වල විශේෂිත සවි කිරීම් වර්ග, ලියවන පට්ටල් හෝ මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩ ගෑමේ යන්ත්‍ර වැනි වැඩපල යන්ත්‍ර ක්‍රියා කරවීම.
   (ඇ) ඇඳීම් කියවීම සහ අවබෝධය පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
3. කාර්මිකයෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
4. වයස : අවුරුදු 45 නොවැඩි විය යුතුය.

**සටහන**

(අ) මෙම තනතුර සඳහා මෝටර් කාර්මික (Motor Mechanic) ක්ෂේත්‍රයෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

(ආ) පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලබා ඇති සේවා සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එම සහතිකවල පිටපත් අමුණා නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් සුදුසුකම් නොමැති ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 2. වඩු කාර්මික (Carpenter) II ශ්‍රේණිය

වැටුප් පරිමාණය : රු. 15650 - 16x140-17890 (U-PL3III)

**සුදුසුකම්**

1. කියවීමට හා ලිවීමට හැකියාවක් තිබිය යුතුය.
2. (අ) ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ කර්මාන්තය සම්බන්ධ වැඩවලදී පාවිච්චි වන නොයෙකුත් පිරිද්දුම් (Joints) සහ එම පිරිද්දුම් සකස් කිරීම.
   (ආ) නොයෙකුත් අන්දමේ වඩු ආවුද හා නොයෙකුත් දැව වර්ග පාවිච්චිය හා ඇඳීම් කියවීම.
   (ඇ) අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් නිවැරදිව කියවීම පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
3. වඩු වැඩ පිළිබඳව අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
4. වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන**

(අ) පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලබා ඇති සේවා සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එම සහතිකවල පිටපත් අමුණා නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් සුදුසුකම් නොමැති ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 3. ගබඩාකරු (Storeman) II ශ්‍රේණිය

**(මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල ඒකකය, මහඉලුප්පල්ලම)**

වැටුප් පරිමාණය : රු. 14150 - 15x130-16100 (U-PL1 (III)

(මේ සඳහා මහඉලුප්පල්ලම හා ඒ අවට ප්‍රදේශවල අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් භාරගනු ලැබේ)

**සුදුසුකම්**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ සහ ශුද්ධ ගණිතය/ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය යන විෂයයන් සහිතව අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්වීම.
2. පිළිගත් ගබඩාවක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබිය යුතුය.
3. වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන**

(අ) ඉංග්‍රීසි භාෂාව ලිවීමට හා කියවීමට හැකියාවක් තිබීම අමතර සුදුසුකමක් වේ.

(අ) පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලබා ඇති සේවා සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එම සහතිකවල පිටපත් අමුණා නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් සුදුසුකම් නොමැති ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන :**

(අ) ඉහත සඳහන් වැටුපට අමතරව, රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව හා රු. 8000/= ක අන්තර් දීමනාවක්ද, මූලික වැටුපෙන් 20% ක් වන විශේෂ දීමනාවක්ද මූලික වැටුපෙන් 20% ක් වන අතුරු දීමනාවක්ද, මූලික වැටුපෙන් 20% ක් වන අමතර දීමනාවක්ද මාසිකව ගෙවනු ලැබේ.

(ආ) රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ. කෙසේ වුවද එබඳු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/ සංස්ථා මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර, ඒ සමග සහතික කරන ලද වර්තමාන වැටුප් විස්තර ද එවිය යුතුය.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයටද දායක වනු ඇත. ඒ අනුව සේවකයාගේ වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන අතර, එම වැටුපෙන් 7% කට හා 8% කට සමාන වන කොටස් සේව්‍යයා විසින් පිළිවෙලින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. මීට අමතරව සේව්‍යයා විසින් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

(ඈ) අයදුම්කරුවන් තම සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ආදී විස්තර හා තමන් පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් ද ඇතුළත්ව අයදුම්පත් 2015.07.06 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර පෞද්ගලිකව භාර දෙන අයදුම්පත් සම්බන්ධව වග කියනු නොලැබේ. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.**
**2015.06.15**